**ගොඩකවෙල ප්‍රාදේශීය සභාව - 2020**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු. 4,431,778 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂය සඳහා මෙහෙයුම් ආදායම සහ ජංගම වත්කම් ඒ හා සමාන ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | 2020 වර්ෂයට අදාලව උසාවි දඩ මුදල් පැල්මඩුල්ල හා ඇඹිලිපිටිය උසාවි මඟින් උපලේඛන සකස් කර අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වූ බැවින් අවසන් ගිණුම් සකස් කිරීමට පෙර එම දඩ මුදල් සම්බන්ධ තොරතුරු ලබා දීමට නොහැකි වූ බව. | සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ගොඩකවෙල පොදු වෙළඳ සංකීර්ණයේ කුට්ටි ගල් ඇතිරීමේ ව්‍යාපෘතිය සඳහා සබරගමුව පළාත් සභාව මඟින් ලද ප්‍රතිපාදන ඇතුළුව එකතුව රු.1,731,102 ක් වැයකර තිබුණද, රු. 2,731,102 ක් ලෙස ප්‍රාග්ධනිත කිරීමෙන් ඉඩම් හා ගොඩනැගිලි ගිණුමේ ශේෂය සහ ප්‍රාග්ධන යෙදූමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු. 1,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. සංවර්ධන වැඩසටහනට අදාල මුළු වියදම ප්‍රාග්ධන ආදායම් ලෙස බිල්කිරීමෙන් වර්ෂය අවසාන දිනට හිඟහිටි ප්‍රාග්ධන ආධාරවල වටිනාකම රු.731,102 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල ආදායම් වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මාදම්පේ මාළු වෙළඳපොලට අදාල පිරිවැය රු. 5,654,649 ක ගොඩනැගිලි ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාල වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඈ) | නාගරික සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධව ආරම්භ කර පවත්වාගෙන යන ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් නොකිරීමෙන් වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම රු. 1,693,333 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද, මෙම ගිණුමට රැස්වෙන මුදල් ආදායම් ලෙස හඳුනා නොගැනීමෙන් වර්ෂයේ මෙහෙයුම් ආදායම රු. 228,234 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සභාවට ලැබෙන සියළු ලැබීම් සහ ගෙවීම් සභාවේ මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,004,505 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,637,639 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 3,327,855 ක් වූ හිඟ වරිපනම් ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟව පවතින වරිපනම් බදු අයත් පුද්ගලයන්ට ලිපි මාර්ගයෙන් දැනුවත් කිරීම, කාර්තු 02 කට වැඩියෙන් හිඟ වරිපනම් බදු සඳහා ජංගම සේවා පැවැත්වීම, රතු නිවේදන යැවීම නිරන්තරයෙන් සිදුකර ආදායම් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 138,738 ක් වූ හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අක්කර බදු සතොයක්ෂණ කමිටුවක් පත්කර එමඟින් ඉඩම් වල අයිතිය තහවුරු කර ගැනීම මඟින් හිඟ අක්කර බදු ශේෂය පියවා ගැනීමට කටයුතු කරනු ලබන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකළ යුතුය. |
| **(ආ)** | **වෙනත් ආදායම්** | | |
| | 2020 වර්ෂය සඳහා සිදු කරනු ලද දැන්වීම් පුවරු සමීක්ෂණය අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු. 444,726 ක හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වනවිට අනවසර දැන්වීම් පුවරු ගලවා ඉවත්කර ඇති බව. | හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල පිහිටි දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 38 ක් වෙනුවෙන් බලපත්‍ර ගාස්තු වශයෙන් රු. 102,000 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ දෙසැම්බර් මස කරන ලද සමීක්ෂණයට අදාලව හඳුනාගත් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 34 ක් සඳහා බදු මුදල් ගෙවීමට අදාල පළමු ලිපිය මේ වනවිට යොමුකොට ඇති බව. | සභාවට අයවිය යුතු ආදායම් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තුගත වියදම රු. 3,615,000 ක් වූ කසළ ද්‍රව්‍ය ගබඩා කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ රු. 2,753,315 කට 2019 ජූනි 03 දින ගිවිසුම්ගතව තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2019 සැප්තැම්බර් 03 දින වනවිට වැඩ නිමකල යුතු වුවද, කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත 2019 නොවැම්බර් 18 දක්වා ගිවිසුම්ගත කාලය දීර්ඝ කර තිබුණි. එම කාල සීමාව තුලද කර්තව්‍යය නිම නොකිරීම තුල 2020 දෙසැම්බර් 04 දිනැති ලිපිය මඟින් ගිවිසුම අවලංගු කර අසාධු ලේඛනගත කර තිබුණි. තවද, භෞතික ප්‍රගතිය සියයට 70 ක් වූ උක්ත කර්මාන්තය වෙනුවෙන් රු. 1,900,000 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර, විගණිත දිනය වූ 2021 මාර්තු 31 දින වනවිටත් එම කර්තව්‍යය නිමකිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු ගිවිසුම්ගත කාලසීමාව සහ අතිරේක කාලසීමාව තුල ද ඉදිකිරීම අවසන් කිරීමට නොහැකි වීම මත ගිවිසුම අවලංගු කර අසාධු ලේඛන ගතකර ඇති බවත්, ඉතිරිව ඇති වැඩ කොටස සඳහා ඇස්තමේන්තුවක් සකස් කරමින් පවතින බව. | සැලසුම් කළ පරිදි සංවර්ධන වැඩ නියමිත කාලය තුල අවසන් කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් උනන්දු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1800 ක් පමණ බැහැර කිරීම සඳහා රු. 11,156,011 ක පිරිවැයක් හා කාර්යය මණ්ඩල සේවකයින් 24 දෙනෙකු ද වාහන සහ යන්ත්‍ර උපකරණ 05 ක් ද යොදවා තිබූ නමුත් පරිසර හිතකාමී අන්දමින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | බලවින්න බණ්ඩාරහේන්යාය නැමති ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් පූර්ණ අයිතිය ගොඩකවෙල ප්‍රාදේශීය සභාවට නොපැවරීම සහ කසළ කළමනාකරණ ව්‍යාපෘතියට මුදල් යෙදවීමට නොමැතිවීම නිසා තවමත් එය ආරම්භ කිරීමට නොහැකි වී ඇති බව. | ඉඩමේ පූර්ණ අයිතිය සභාව වෙත පවරාගෙන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |